දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/11/AT/Steno/2024

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2025.02. 6

ලේකම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**
**කම්කරු විනිශ්චය සභා ලඝු ලේඛක නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු**

ඉහත සඳහන් සේවාවෙහි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු, 2025.02.17 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, ඉහත සේවාවෙහි නිලධාරීන්ගේ 2025 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් ද එම දින සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වේ.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05. 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(v) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. තවද, 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් යම් නිලධරයකු ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳව ගැටළු සහගත තත්වයක් පවතින අවස්ථාවක දී, අදාල නිලධාරියාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

08. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Mday

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# වාර්ෂික ස්ථානමාරු අභියාචනා තීරණ - 2025

| අනු අංකය | ජාතික හැඳුනුම්පත් අංක | නම | ශ්‍රේණිය | වත්මන් සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රා.සේ.කො.ස. තීරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 957132391V | එච්.ටී.එච්.මධුෂානි | III | කම්කරු විනිශ්චයාධිකාරය අංක 09 - නුවරඑළිය | කම්කරු විනිශ්චයාධිකාරය අංක 38 - නාවලපිටිය | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 2 | 886070470V | එච්.එල්.සී.ඩී.එස්. ද සිල්වා මිය | III | කම්කරු විනිශ්චයාධිකාරය අංක 24 ගම්පහ | ස්ථාන මාරුවක් ලබා දී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම සහ තාවකාලික අනුයුක්තය 2026.01.01 දින දක්වා දීර්ඝ කිරීම |
| 3 | 886070470V | එච්.එම්.එන්. මධුෂානි | III | කම්කරු විනිශ්චයාධිකාරය අංක 44- අම්පාර | ස්ථාන මාරුවක් ලබා දී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 4 | 198656800988 | ඩබ්. එස්.ඒ. ජයරත්න | III | කම්කරු විනිශ්චයාධිකාරය අංක 6 රත්නපුර | ස්ථාන මාරුවක් ලබා දී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 5 | 916132166V | එම්.බී.එච්.යසින්තා | III | කම්කරු විනිශ්චයාධිකාරය අංක 21 මීගමුව | ස්ථාන මාරුවක් ලබා දී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |

28/01/2025

28/01/2025